# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2239/67 - 2021 අගෝස්තු මස 07 වැනි සෙනසුරාදා - 2021.08.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

*යොමු අංකය* :- BD/PS/LND/4/1/15-111.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියට යටත්ව අංක **2016/15** හා **2014.04.25** දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ, 7A පිටුවේ අංක 91 ලෙසින් දැක්වෙන කැබලි අංක 823 ලෙසින් දක්වා ඇති ඉඩම් විස්තරයේ ඉඩම් ප්‍රමාණය ලෙසින් සඳහන් කර ඇත්තේ හෙක්ටයාර 0.0091 ක් ලෙසින් වන අතර මිනින්දෝරු අධිකාරිගේ අංක B/PSS/2020/326 හා 2020.11.24 දිනැති අනුරේඛනයේ අක්ෂර B ලෙස සඳහන් වන කොටසෙහි ප්‍රමාණය 0.0159 ලෙස සඳහන් වේ. ඒ අනුව මෙම ඉඩම් කොටසේ ප්‍රමාණය පහත පරිදි නිවැරදි කර නැවත *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා

**කැබලි අංක 823**

**කැබලි අංක 823 ප්‍රමාණයෙන් හෙක් 0.0250**

ඉඩමේ නම: මලබඩගහ වත්ත; ඉඩම් පරිහරණය: මාර්ගය, හිමිකම් කියන්නා: පුද්ගලික, වෙනත් කරුණු :කැබලි අංක 189 හි කොටසක්, (හි.පී.77847හි කොටසක්) බදුල්ල-චෙන්කලාඩි මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියට අදාළව වැඩිපුර අත්කර ගැනීමට යෝජිත ඉඩම් හඳුනාගැනීම සඳහා (ව.මී. 159).

එන්. ජේ. ටී. අනුරාධා,
ප්‍රාදේශීය ලේකම්
පස්සර.

2021 මැයි මස 07 වැනි දින,
පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08- 259

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**7 වන වගන්තිය යටතේ දැන්වීමයි**

යොමු අංකය :- දො/ඉ/1/අත්/117.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධනය පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:-*

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 728E බෝම්බුවල දකුණ ග්‍රාම නිලධාරී වසම තුල පිහිටි මණ්ඩඩියාවත්ත *හෙවත්* මණ්ඩියා ලන්දවත්ත 4830 මූලික පිඹුරේ නිරූපණය කර ඇති,

**කැබලි අංක 1**

ඉඩමේ නම: මණ්ඩඩියාවත්ත *හෙවත්* මණ්ඩඩියා ලන්දවත්ත; හිමිකම් කියන්නාගේ නම :- දයානි රේණුකා තොටගමුව අංක 129, දිබ්බැද්ද, පානදුර, ප්‍රමාණය හෙක්ටයාර් 0.4091

1A - G 34789 – 16 (2021/08)

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2021 සැප්තැම්බර් මස 29 වැනි දින පූ.භා. 10.30ට දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද 2021 සැප්තැම්බර් 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 2ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ආර්. එම්. දර්ශනා රණසිංහ,
ප්‍රාදේශීය ලේකම්
දොඩන්ගොඩ.

2021 අගෝස්තු මස 04 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08- 322

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.